# වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

# පුරප්පාඩු

## සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (සතොස) පහත සඳහන් පුරප්පාඩු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රධාන විධායක නිලධාරී -ප්‍රධාන කාර්යාලය සඳහා

**බඳවා ගැනීමේ ක්‍රමවේදය - වැටුප් පරිමාණය**

(HM 2-1 - 2025 රු. [161,140 - 12 X 4,850 - 219,340])

**සුදුසුකම්**

01.

(අ) ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගිණුම්කරණය හෝ වාණිජ්‍යය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම.

**සහ**

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සනාථ කළ වාර්තාවක් සමග **"කළමනාකරණ මට්ටමින්"** අවම වශයෙන් වසර 17ක පළපුරුද්දක් ලබා තිබීම. (ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් විය යුතුය)

02.

(අ) ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගණකාධිකරණය හෝ වාණිජ්‍යය, යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සහ**

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය ලබා තිබීම සහ ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක සනාථ කළ වාර්තාවක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද ලබා තිබීම.

***2024.01.12 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව**

ඉහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් **2026.08.31** දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුරු නාමය දැක්විය යුතුය.

.

**සභාපති,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**